www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) ව්‍යාපාරයට එක් වන්න

## Join the International Students for Social Equality (ISSE)

මිලිටරිවාදී ප්‍රචන්ඩත්වයට ද සමාජ අසමානතාවට ද ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එරෙහිව වැඩෙමින් පවත්නා ප්‍රහාරයන්ට ද එරෙහිව උද්ඝෝෂනයක් ඇරැඹීමට සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ලොව පුරා වෙසෙන ශිෂ්‍ය තරුන-තරුනියන්ට කැඳවුම් කරයි.

එක්සත් ජනපදය තුලත් ජාත්‍යන්තරවත් පැන නැගී ඇති දැවැන්ත විරුද්ධත්වය හමුවේ ඉරාකය තුල ඇමරිකානු වාඩිලා ගැනීම ඉහල නැංවීම වනාහි ලෝක ධනවාදය විසින් නිර්මිත ව්‍යසනයේ වඩාත්ම ම්ලේච්ඡ ප්‍රකාශනයයි. ඇමරිකානු පාලක ප්‍රභූවේ භූ-දේශපාලනික අරමුනු සාක්ෂාත් කර ගනු වස් බේගල් මත පදනම් වෙමින් සාධාරනීකරනය කරන ලද මෙම නීති විරෝධී ආක්‍රමනය හා වාඩිලා ගැනීම තුල සිය දහස් ගනනක් මරු මුවට පත් වූහ. දැන්, දෙවන ලෝක යුද්ධයෙන් පසු නොදුටු පරිමානයේ භූගෝලීය යුද වහ්නි ජාලයක අනතුර මතු කරමින්, ඉරානයට එරෙහි වඩාත් මිනීමරු යුද්ධයකට සැලසුම් සූදානම් කොට ඇත.

මෙම උමතුව නතර කල යුතුයි! විද්‍යාවේ සහ තාක්ෂනයේ දැවැන්ත ජයග්‍රහනයන් ආර්ථික ජීවිතයේ පෙර නොවූ විරූ භූගෝලීය ඒකාග්‍රතාවය සමග එක්ව මානව සමෘද්ධියේ නව යුගයක ශක්‍යතාව නිර්මානය කොට ඇත. එනමුදු තරුන ජනයා මුහුන දී සිටින්නේ යුද්ධයෙන් හා අගහිගකමෙන් ද දැවැන්ත භූගෝලීය දරිද්‍රතාවෙන් හා වසංගතයන්ගෙන් ද පරිසර ව්‍යසනයක පෙර නිමිති වලින් ද සංස්කෘතික පසුගාමිත්වයෙන් හා අන්ධ විශ්වාසයන්ගෙන් ද අති මූලික ප්‍රජාතන්ත්‍රීය නිදහසට එල්ල කෙරෙන නිරන්තර ප්‍රහාරයන්ගෙන් ද සපිරුනු ලෝකයකටයි.

සංගතයන්හි ලාභ අවශ්‍යතා සඳහා ද ජනගහනයේ තුනී තට්ටුවක පුද්ගලික ධන සමුච්ඡය සඳහා ද සියල්ල යටත් කෙරුනු ධනවාදී සමාජ සබඳතා විසින් මානව සමාජයේ ප්‍රගමනය වලකනු ලැබ ඇත. සසජාශි යනු, දරිද්‍රතාව හා යුද්ධය නිමා කරමින් සැබෑ නිදහසට සහ සමානතාවයට පදනම් දැමියහැකි නව යුගයේ ශක්‍යතාව අවසානයේ දී සාක්ෂාත් කෙරෙන්නාවූ සමාජවාදී ව්‍යාපාරයක් ගොඩ නැගීම සඳහා කැප වූ ලොව පුරා ශිෂ්‍යයන්ගේ ව්‍යාපාරයයි.

නවීකෘත සමාජවාදී ව්‍යාපාරයක් ගොඩ නැංවීමේ සටනට එක් වන්න! සසජාශි ව්‍යාපාරයට බැඳෙන්න!

### යුද්ධය සහ විජිතවාදය එපා!

විජිතවාදය, අධිරාජ්‍යවාදය, ෆැසිස්ට්වාදය, ලෝක යුද්ධය ආදී 20 වන සියවසේ ම්ලේච්ඡ හිංසනයන් වඩාත් කෲරතර ආකාරයෙන් 21 වන සියවසේදී නැවත හිස ඔසවමින් පවතී. ඉරාකය සහ ඇෆ්ඝනිස්ථානය ආක්‍රමනය කිරීම සහ වාඩි ලා ගැනීම වනාහි බුෂ් විසින් පවසන ලද "21 වන සියවසේ යුද්ධයන්" ගේ ප්‍රථම අදියර පමනකිග මෙම යුද්ධයන් සේවය කරනු ලබන්නේ එක් මූලික අරමුනක් සඳහායි. එනම් මිලිටරි බලය යොදා ගැනීම හරහා ලෝක ආර්ථිකය තුල ඇද වැටෙමින් පවත්නා තම ස්ථානය ප්‍රතිතුලනය කර ගැනීම මගින් ඇමරිකානු පාලක ප්‍රභූවේ භූගෝලීය අවශ්‍යතා ආරක්ෂා කර ගැනීමයි. ඇමරිකානු ආන්ඩුව විසින් වපුරන ලද අන් සියලුම තර්කයන් මුසාවන්ය.

ලාන්සට් නම් වූ බ්‍රිතාන්‍ය වෛද්‍ය ජර්නලයේ පල කරන ලද ජෝන්ස් හොප්කින්ස් සරසවියේ සමීක්ෂකයන් විසින් කරන ලද අධ්‍යනයක වාර්තාවට අනුව ඉරාකීයන් 655000 කට අධික සංඛ්‍යාවක් තම රට ආක්‍රමනය කිරීම සහ වාඩිලා ගැනීම හේතුවෙන් මිය ගොස් ඇත. එක්සත් ජනපද සොල්දාදුවන් 3200 කගේ ද අන්‍ය රටවල සොල්දාදුවන් 250 කට අධික සංඛ්‍යාවකගේ ද ජීවිත ද ඒස මගම අහිමි වී ඇතග ආක්‍රමනයෙන් සහ වාඩිලා ගැනීමෙන් සමස්ත සමාජයම විනාශභාග් වූ අතර කුරිරු ආගමික ගැටුමක් ඇවිලවින.

2006 මැතිවරනය මගින් ජනගහනයේ අති මහත් බහුතරයේ යුද විරෝධී මතය පිලිබිඹු කල අතර මෙම මතය ලොව පුරා බිලියන සංඛ්‍යාත ජනයාගේ ද මතයයි. එසේ වුව ද එක්සත් ජනපද ආන්ඩුවේ ප්‍රතිචාරය වූයේ මෙම සාපරාධී ව්‍යවසාය තුල මරා දමනු සඳහා තව තවත් තරුන සොල්දාදුවන් ඉරාකයට යැවීමයි. ක්ෂිතිජයෙහි දිස්වන්නේ යුද්ධයේ වෙඩි උන්ඩ ලෙස සේවය කරනු වස් තරුන ජනයා තල්ලු කර දැමීමට නව මාවත් සොයන පාලක ප්‍රභූව විසින් ක්‍රියාවට දැමීමට සූදානම් වන මිලිටරි පනතක තර්ජනයයි.

තම අධිරාජ්‍යවාදී අභිලාෂයන්හි සඳහා ක්‍රියාත්මක වන්නේ එක්සත් ජනපදය පමනක් නොවේ. යුරෝපයේ, ඕස්ට්‍රේලියාවේ සහ ආසියාවේ ප්‍රධාන බලයන් විසින් මීට සමාන විජිතවාදී ව්‍යාපෘති සැලසුම් කොට ක්‍රියාත්මක කෙරෙමින් පවතී. එකිනෙකට වෙනස් ධනේශ්වර බලයන් එකිනෙකාට එරෙහිව පිහිටුවමින් ලෝක සම්පත් කුට්ටි කර ගැනීම සඳහා කෙරෙන ධාවනය අනිවාර්යයෙන්ම තවත් ගෝලීය යුද ගිනිමැලයකට තුඩු දෙනු ඇත.

කවර හෝ අධිරාජ්‍ය විරෝධී පූර්වානමක් ඉතිරිව පැවතියේ නම් එය ද සැනෙකින් හැර පියා, ඉන්දියානු උප මහාද්වීපය තුල සියලු ආන්ඩු ඇෆ්ඝනිස්ථානය හා ඉරාකය ආක්‍රමනය කිරීමට පිටු බලය දුන්හ. අනුප්‍රාප්තික ඉන්දීය ආන්ඩු නොබැඳි පිලිවෙත් ව්‍යාජය අත් හැර වොෂින්ටනය සමග මූලෝපායික සහයෝගීතාවක් වැලැඳ ගති.

තමාගේම අරමුනු උදෙසා යොදා ගැනීමේ අටියෙන් ශ්‍රී ලංකාව තුල සියලුම ප්‍රධාන පක්ෂ බුෂ් පරිපාලනයේ" ත්‍රස්තයට එරෙහි යුද්ධයට" උදව් කලහග ජනාධිපති මහින්ද රාජපක්ෂ එක්සත් ජනපදයේ ආවෘත පිටු බලය සහිතව, සාකච්ඡාමය සාමයක් සඳහා කවර හෝ ඉඩක් නොතබා, රට නැවත සිවිල් යුද්ධයට ඇද දමමින් තමාගේම ඉවබව නැති මිලිටරි මදාවියන් දියත් කලේය. පසු ගිය මාස 15 තුල පමනක් 4000 කට වැඩි ප්‍රමානයක් යුද්ධය හේතුවෙන් මිය ගිය අතර 200000ක් අවතැන් වූහ.

ලොව තරුන ජනයාට ලාභය සඳහා මංකොල්ල කෑමේත් මිනී මැරීමේත් ආසක්තයක් නොමැත. ලෝකයේ කම්කරු ජනතාව සහ තරුන-තරුනියන් මිලිටරිවාදයට අධිරාජ්‍යවාදී මංකොල්ලයට සහ වාර්ගික පීඩනයට එරෙහිව පොදු අරගලයක් තුල ඒකාබද්ධ විය යුතු ය.

## සමාජ සමානතාවය සඳහා!

යුද්ධය සම්බන්ධයෙන් වන විරුද්ධත්වය යුද්ධය නිර්මානය කරන සමාජ පද්ධතිය කෙරෙහි වන විරුද්ධත්වයෙන් වෙන් කල නොහේ. ශිෂ්‍යයින් අද දින මුහුන දී සිටින්නේ සමාජ අසමානතාවයේ වඩාත් අශික්ෂිත මට්ටම්වලින් සෑම අතින්ම දූෂිත හා රෝගී සමාජයකටයි. ජාත්‍යන්තරව ධනය සංකේන්ද්‍රනය වී ඇත්තේ ඉතා කුඩා ප්‍රභුවක් අතයි.

ලෝක ජනගහනයෙන් පොහොසත්ම සියයට 1 ලබා ගන්නා ආදායම සමාජ පත්ලේම වන සියයට 57 ලබා ගන්නා සමස්ත ආදායමට සම වේ. ලොව ධනවත්ම පුද්ගලයින් තිදෙනාගේ වත්කම් දුප්පත්ම සියයට 10 සතු වත්කමට වැඩි ය. සෑම ප්‍රධාන රටකම අසමානතාව වර්ධනය වෙමින් පවතී. කම්කරු ජනයාගේ වැටුප් මට්ටම් පහත වැටෙද්දී ආහාර, ජලය. නිවාස, සෞඛ්‍ය පහසුකම් හා අධ්‍යාපනය වැනි අති මූලික අවශ්‍යතාවල අග හිග කමින් බිලියන සංඛ්‍යාත ජනයා දුක් විඳිති. පසුගිය දශක කීපය තුල නිශ්පාදන බල වේගයන්හි ඇතිවූ දැවැන්ත ප්‍රසාරනයේ ඵල මුලුමනින්ම වාගේ නෙලා ගනු ලැබුවේ නව ලාභ ශ්‍රම සම්පත් සහ අමු ද්‍රව්‍ය සොයමින් ලොව පීරන මහා සංගතයන් පාලනය කරනු ලබන පටු කතිපයාධිකාරයක් විසිනි.

කුඩා ප්‍රභුවක් අත වත්කම් සංකේන්ද්‍රනය වීම සම්බන්ධයෙන් ආමන්ත්‍රනය නොකොට, ඒඩ්ස් වසංගතය සහ අනෙකුත් රෝගයන්, අඛන්ඩව පවත්නා දැවැන්ත දරිද්‍රතාව හා සුලි සුලං සහ සුනාමි වැනි ස්වභාවික විපත් වලින් මිලියන සංඛ්‍යාත මහ ජනතාවට සිදුවන ව්‍යසනයන් වැනි භූගෝලීය සමාජ ප්‍රශ්න කිසිවකට ගැඹුරින් ආමන්ත්‍රනය කල නොහැක.

සමාජ අසමානතාව පිලිබිඹු කෙරෙන සුවිශේෂී ප්‍රශ්නවලට ශිෂ්‍යයෝ ජාත්‍යන්තරව මුහුන දෙති. දකුනු ආසියාවේ බොහෝ තරුන ජනයාට මූලික අධ්‍යාපනයට වැඩි යමක් නොලැබේ. ඉන්දියාව තුල අසාක්ෂරතාව මෙතෙකුදු සියයට 50ට වැඩි ය. විශ්ව විද්‍යාලවලට සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුලු වීමේ වරම් ලබා ගන්නා ඉතා කුඩා ප්‍රතිශතයක් වන තරුන ජනයා පහසුකම්වල සහ පුහුනු කාර්ය මන්ඩලවල හිගයට නිරතුරුව මුහුන දෙති. එමෙන්ම තම මූලික ජීවන අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය මුදල් අග හිග කම හේතුවෙන් ජීවිතය යන්තමින් ගැට ගසා ගන්නා අතර උපාධිධාරීහු අති මහත් සංඛ්‍යාවක් රැකියාවක් සොයා ගත නොහැකිව සිටිති.

1950 ගනන් සහ 1960 ගනන්වල ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව සියයට 85 වඩා ඉහල නැංවූ මහජන අධ්‍යාපනය සෑම මට්ටමකින්ම පිරිහෙමින් පවතී. පාසල් නොයන සිසුන් සංඛ්‍යාව නාටකීයව ඉහල යමින් පවතී. යුද්ධය යලි ඇරඹීම හේතුවෙන් යාපනයේ 10201 ක් දරුවන්ට පාසල් අධ්‍යාපනය අහිමි කෙරින. උසස් පෙල විභාගයෙන් සමත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් සරසවි වරම් ලැබෙන්නේ සියයට 16 කට පමනි.

ලොව පුරා වන දැවෙන සමාජ ප්‍රශ්න විසඳීම සඳහා සහ ජීවන කොන්දේසි ඉහල නැංවීම සඳහා, සමාජය සතු නිශ්පාදන ධාරිතාවන් භාවිතාවේ යෙදවීමටත් ඒවා වර්ධනය කිරීමටත් යොමු වූ තාර්කික සහ ප්‍රජාතාන්ත්‍රික සැලසුමක් සමග ඒකාබද්ධ කෙරුනු, සමාජ සම්පත්වල දැවැන්ත යලි බෙදා හැරීමක් අත්‍යවශ්‍ය කෙරේ. එය

ධනවත් අතලොස්සකගේ ලාභ අවශ්‍යතා සඳහා නොව මහ ජනතාවගේ සමාජ අවශ්‍යතා සඳහා විය යුතු ය.

## ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අරක්ෂා කරනු!

එක්සත් ජනපදයේ, ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තරව ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරයන්ගේ හදවතේ පවත්නේ සමාජ අසමානතාව යි. පාලක පංතියේ අවශ්‍යතාවන් මහ ජනතාවගේ ඉල්ලීම් සමග වඩ වඩාත් ගැටෙත්ම දේශපාලන සංස්ථාපිතය විසින් ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරය තීව්‍ර කෙරේ.

තමාගේම රට තුලමත් ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට පහර එල්ල කරන අතරතුර තමා ලොව පුරා අනෙකුත් රටවලට ප්‍රජාතන්ත්‍රවාදය ගෙන ඒම සඳහා උත්සාහයක යෙදීසිටින බවට ඇමරිකානු ආන්ඩුව බේගල් ප්‍රචාරය කරමින් සිටී. ඇමරිකානු මහජනතාවගේ නාමයෙන් ලෝක මහජනතාවට එරෙහිව සිදු කෙරෙමින් පවත්නා මිලේච්ඡත්වයන්ට එරෙහිව සටන් කිරීමට ශිෂ්‍ය තරුන-තරුනියන් ගැඹුරින්ම කැප විය යුතු ය.

ඉන්දු උප මහාද්වීපය පුරා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පරදුවට තැබී ඇත. පකිස්ථානයේ ඇත්තේ මිලිටරි ඒකාධිපතිත්වයකිග ඉන්දියාවේ සහ බංග්ලාදේශයේ ප්‍රජාතන්ත්‍රවාදය නාමික ය. පොලිස් කුරිරුකම්, දේශපාලනික දූෂනය සහ කම්කරුවන්ගේ සහ ගම්බද දුගීන්ගේ මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අපහරනය සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇත. වාර්ගික වෙනස්කම් සහ කුල පීඩනය ධනේශ්වර පාලනය යටතේ නිත්‍ය ලක්ෂනයකි.

ශ්‍රී ලංකාව තුල මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට දුර දිග යන ප්‍රහාරයන් එල්ල කිරීම සඳහා රාජපක්ෂ ආන්ඩුව විසින් යලි ඇරැඹි සිවිල් යුද්ධය යොදා ගැනින. මිලිටරි අනුග්‍රහය ලද ඝාතක කල්ලි විසින් සිය ගනනක් තරුන ජනයා පහැර ගනු ලැබින. මින් බොහෝ දෙනෙකු කුප්‍රකට ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ චෝදනා රහිතව රඳවා තබා ඇත.

ලොව පුරා ආන්ඩු පොලිස් රාජ්‍ය පියවර ගැනීම මගින් පෙන්නුම් කෙරෙන්නේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහි ප්‍රහාරය ජාත්‍යන්තර ප්‍රපංචයක් බව යි. සාධාරන නඩු විභාගයක් සඳහා වන අයිතිය, හබයාස් කෝප්පුස් අයිතිය, ප්‍රකාශනයේ සහ රැස්වීමේ අයිතිය හා වධ බන්ධනයනට යටත් නොවී සිටීමේ අයිතිය වැනි ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කොට පවත්වා ගත හැක්කේ සමාජ සමානතාව සඳහා කෙරෙන ජාත්‍යන්තර අරගලයේ කොටසක් ලෙස පමනකි. අවසානයේ දී ධන සමුච්ඡයේ ආන්තික මට්ටම් සමග ප්‍රජාතන්ත්‍රවාදය නොපැහේ. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ආර්ථික ජීවිතය තුල ප්‍රජාතන්ත්‍රවාදය ආවශ්‍යක කෙරේ.

## ජාත්‍යන්තර සමාජවාදය සඳහා!

අවසාන විශ්ලේශනයේදී අද දින අප මුහුන දෙන සෑම ප්‍රධාන සමාජ ප්‍රශ්නයකටම මෙම අර්බුද ග්‍රස්ථ සහ යල් පිනූ ධනේශ්වර පද්ධතිය වග කිව යුතු ය. ධනවාදය යටතේ ඊනියා "සම අවස්ථා" සහ "නීතිය යටතේ සමානතාවය" යන්න ප්‍රෝඩාවකි. සැබෑ සමානතාවට සමාජ සමානතාවය ආවශ්‍යක කෙරේ. නමුදු ධනවත් ප්‍රභූවක අවශ්‍යතාවන් සහ ඔවුනගේ ලාභ අරමුනු උදෙසා සියලු මානව අවශ්‍යතා යටත් කෙරුනු සමාජයක සමාජ සමානතාවය විය හැක්කක් නොවේ.

කම්කරු පන්ති ව්‍යාපාරය විසින් පෙර යුගයන්හි දී දකුනු ආසියාව තුලද ජාතන්තරව ද ලබා ගත් අත්දැකීම් මත පදනම් වූ ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් පුනර්ජනනය කිරීම සඳහා සසජාශි සටන් වදී. "සමාජවාදය අසමත් විය" යන්නෙන් නිතර ජප කෙරෙන මන්ත්‍රය වනාහි නූගත්කමේ හෝ වංචාවේ නිර්මිතයකි. ආසියාවේ, යුරෝපයේ, එක්සත් ජනපදයේ සහ ජාත්‍යන්තරව සිදුවූ අරගලයන් ද ඇතුලත් ශ්‍රේෂ්ඨ විප්ලවවාදී අරගලවලින් 20 වන සියවස සංලක්ෂිත විය. නමුදු මෙම අරගලයන් ස්ටැලින්වාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සහ පැරැනි කම්කරු ව්‍යාපාරයේ දූෂිත නිලධාරි තන්ත්‍රය විසින් ශ්‍රී ලංකාවේ දී නම් අවස්ථාවාදී ලංකා සමසමාජ පක්ෂය විසින් ක්‍රමානුකූලව පාවා දුනි. සසජාශි ආවේශය ලබන්නේ මාක්ස්, එංගල්ස්, ලෙනින්, ලක්සම්බර්ග් සහ ට්‍රොට්ස්කි වැන්නවුන්ගේ ඇසුර ලද ජාත්‍යන්තර සමාජවාදයේ ශ්‍රේෂ්ඨ බුද්ධිමය සහ දේශපාලනික සම්ප්‍රදායෙනනි.

අප මුහුන දෙන කවර හෝ ප්‍රශ්නයක් ජාතික මට්ටමේ පොර බැදිය නොහැක. අප ජීවත් වන්නේ ලෝක සමාජයක සහ ලෝක ආර්ථිකයක වන අතර ඕනෑම රටක ශිෂ්‍ය තරුනයන් මුහුන දෙන ගැටලු මූලික වශයෙන් සමාන ය. මේ හේතුව නිසාම අපි සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ වෙමු. සියලු ආකාරයේ ජාතිකවාදයන්, ස්වෝත්තමවාදයන්, වර්ගවාදයන් සහ ප්‍රාදේශීයවාදයන් අපි විසින් ප්‍රතික්ෂේප කරන්නෙමු. අප ඉදිරිපත් කරන්නේ විවෘත දේශ සීමා මූල ධර්මයයිඃ සෑම කෙනෙකුටම තමාගේ කැමැත්ත පරිදි තෝරා ගත් ස්ථානයක පූර්න දේශපාලන සහ සමාජමය අයිතීන් සහිතව ජීවත් වීමට සහ රැකියාව කිරීමට හැකි විය යුතු ය.

අප ශිෂ්‍ය සංවිධානයක් වන නමුදු අපේ අරමුන වන්නේ ශුද්ධ ශිෂ්‍ය ව්‍යාපාරයක් ගොඩ නැගීම නොවේ. දැවෙන අවශ්‍යතාව වන්නේ සමස්තයක් ලෙස, ලෝක ජනගහනයෙන් අති මහත් බහුතරය වන ජාත්‍යන්තර කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගීමයි. ශිෂ්‍ය තරුනයන්ගෙන් බහුතරයක් අද දින කම්කරු පන්තියේ ම කොටසක් බවට පත්ව ඇත. නොඑසේනම් නුදුරේ දී එසේ වනු ඇත. ශිෂ්‍යයන් මුහුන දෙන සුවිශේෂිත ප්‍රශ්න වනාහි සියලු කම්කරුවන්ගේ ශ්‍රමය සූරා කෑම මත පදනම් වූ ධනේශ්වර පද්ධතියේ නිෂ්පාදිතයන් ය.

සියලුම ආකාරයේ ජාතිකවාදයන් හා වර්ගවාදයන් ද පවත්නා පාලනයන්ට පීඩනය යෙදීමේ හා සටන් පාඨ ඉදිරිපත් කිරීමේ රැඩිකල් විරෝධතා දේශපාලනයන් ද සසජාශි ප්‍රත්ක්ෂේප කරයි. විශ්ව විද්‍යාල තුල පවත්නා බොහෝ කන්ඩායම්වල ඉදිරි දර්ශනය සහ ගුනාංගය වන මෙය වඳ සහ බංකොලොත් එකකි. සමාජවාදය යනු සැබෑ සමානතාව බැවින් අපේ අරමුන වන්නේ, බලය ලබා ගන්නා වූ සහ ප්‍රජාතන්ත්‍රවාදී, නිදහස් හා තාර්කික පදනමක් මත සමාජය ප්‍රතිසංවිධානය කරන්නා වූ සුපැහැදිලි සහ විස්තෘත න්‍යායික ඉදිරි දර්ශනයක් මත පදනම් වූ මහජන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැංවීමයි.

ඉන්දු උප මහාද්වීපය තුල දශක ගනනාවක් ධනවාදයට මුක්කු ගැසූ විවිධ ස්ටැලින්වාදී සහ වාම පක්ෂ ඇතුලු දේශපාලන සංස්ථාපිතයේ සියලු පක්ෂවලින් පරිපූර්නව බිඳී වෙන් වීමක් සමාජවාදය සඳහා සටනට ආවශ්‍යක කෙරේ. ශ්‍රී ලංකාව තුල විනාශකාරී සිවිල් යුද්ධය අවසන් කිරීම සඳහා ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නගනු වස් සිංහල, දෙමල සහ මුස්ලිම් කම්කරු හා තරුන ජනයා එකමුතු කිරීමට සසජාශි-සසප උද්ඝෝෂනයේ යෙදේ. උතුරෙන් සහ නැගෙනහිරෙන් සියලු හමුදා වහාම සහ කොන්දේසි විරහිතව ඉවත් කර ගන්නා ලෙස ද දකුනු ආසියාවේ සහ ජාත්‍යන්තරව සමාජවාදය සඳහා කරන අරගලයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලාම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සටන් වදින ලෙස ද අපි ඉල්ලා සිටිමුග

සසජාශි ට බැඳෙන ලෙස සහ එය ගොඩ නගන ලෙස පොදු සමාජ ප්‍රශ්නවලට සහ දේශපාලන අභියෝගයන්ට මුහුන දී සිටින දකුනු ආසියාවේ තරුන ජනයාගෙන් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් අපි ඉල්ලා සිටිමු. සමාජවාදය යනු සැබෑ සමානතාවයිග එමගින් සූරා කෑමේ සහ සමාජ අසමානතාවේ ධනේශ්වර පද්ධතිය නිමාවකට ගෙන එන අතර සමාජයේ දැවැන්ත නිශ්පාදන සම්පත් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකට ගෙන එයි. එනම් මෙම සම්පත්වලට ධනවතුන්ගේ පුද්ගලික ලාභය සහ අවශ්‍යතාවන්ට නොව සමාජමය අවශ්‍යතාවන්ට සේවය කල හැකිවෙයි.

## සමාජවාදය සඳහා සටනට එක් වන්නඃ සසජාශි ව්‍යාපාරයට බැඳෙන්න!

සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ වනාහි හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ඃහජාජක* ලංකා ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂයේ ඃසසප* ශිෂ්‍ය සංවිධානයයි. සසජාශි පිළිබඳව වැඩි විස්තර දැන ගැනීම සඳහාත් එහි ශාඛාවක් ඔබේ විශ්ව විද්යාලයේ හෝ ඔබේ අධ්‍යාපන ආයතනයේ ගොඩ නැගීමට ආධාර කිරීම සඳහාත්' isse@socialequality.com විද්යුත් ලිපිනයට හෝ තැ.පෙ. 1270, කොලඹ යන ලිපිනයට ලියන්න.

හජාජක විසින් අන්තර්ජාලය තුල වඩාත්ම පුලුල් පාඨකය කියවනු ලබන සමාජවාදී ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය (www.wsws.org) ප්‍රකාශයට පත් කරනු ලබයි. දෛනික පුවත් සහ ප්‍රධාන ලෝක සිද්ධීන් පිලිබඳව කෙරෙන විශ්ලේශනයන් සඳහා ද දේශපාලනික සංස්කෘතිමය ඓතිහාසික සහ දාර්ශනික ප්‍රශ්න සම්බන්ධයෙන් කෙරෙන විවරනයන් සඳහා ද ලෝසවෙඅ කියවන්න.

© www.wsws.org